සියලු ම හිමිකම් ඇවිරිණි
*All Rights Reserved*

ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone

**ගම්පහ අධ්‍යාපන කලාපය**
Gampaha Education Zone

**දෙවන වාර ඇගයීම - 2025**
Second Term Evaluation - 2025

| | | |
|---|---|---|
| ශ්‍රේණිය Grade: 6 | විෂයය Subject: නාට්‍ය හා රංග කලාව | කාලය Time: පැය 1 1/2 |

## I කොටස

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **පහත ගීත කණ්ඩ ඇසුරින් 1-5 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A.
එහෙත් හරි වැස්ස
මෙහෙත් හෙම වෙන්නැ
අපොයි හරි වැස්ස
වෙලත් උතුරන්න

B.
සංස්ථාවක් කියල තැනක
ලියන, කියන, අඳින, මහන
කඩදැහි හදලා දෙනවලු
අහක දාන කඩදාසිත්
එතනට මිලයට ගනීලු

C.
සෙල්ලම් සිතින් වත්
යම් කිසි තරහකින් වත්
මරණ සිතකින් වත්
සතුන් හට වද දීම නොහොබින්

B.
අක්කේ දර ටික ගෙට ගනිමු
වැහි පොද වැටෙනවනේ
වතුරත් ඉවරයි කළගෙඩියේ
හනික ළිඳට යමුකෝ

E.
කොච්චි කොටන්නම් රලහාමි
දෙනවද එළුවා
කොච්චර කෙටුවත් නොදෙනෙමි
අපගේ එළුවා

01. ළමා නාට්‍යයකට අයත් දෙබස් කණ්ඩයක් ඇතුළත් පිළිතුර වන්නේ,
1. A 2. B 3. C 4. D

02. ස්වභාවික පරිසරයේ සංසිද්ධියක් ඇතුළත් ගීතයක කොටසක් වන්නේ,
1. A 2. C 3. E 4. D

03. ජන ක්‍රීඩාවකට අදාළ කවියක් ඇතුළත් වන්නේ,
1. B 2. E 3. C 4. A

04. දයානන්ද ගුණවර්ධන මහතා විසින් නිර්මිත වේදිකා නාට්‍යයක දෙබස් කණ්ඩයක් ඇතුළත් වන්නේ,

1. B 2. C 3. A 4. D

05. උපදේශාත්මක කාව්‍ය ග්‍රන්ථයක කවියක් සඳහන්ව ඇත්තේ,

1. C 2. A 3. E 4. D

- **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

06. 'අහස කඩා වැටීම' කතන්දරයේ ප්‍රධාන චරිතය වන්නේ,

1. කුකුළු හාමි 2. මුවා 3. හාවා 4. සිංහයා

07. රංගනයේදී උපයෝගී කරගන්නා භාණ්ඩ හඳුන්වන්නේ,

1. රංග වස්ත්‍රාභරණ 2. නාට්‍යෝපකරණ

3. පසුතල නිර්මාණ 4. අංග රචනා ද්‍රව්‍ය

08. ස්වභාවික පරිසරයෙන් ඇසෙන ශබ්දයක් නොවන්නේ,

1. හෙනහඬ 2. සන්ටාර හඬ 3. වර්ෂාවේ හඬ 4. කුරුළු ගී හඬ

09. නාට්‍ය හා රංග කලාව,

1. ශ්‍රව්‍ය කලාවකි. 2. ශ්‍රව්‍ය දෘශ්‍ය කලාවකි.

3. දෘශ්‍ය කලාවකි. 4. මුද්‍රිත කලාවකි.

10. කිසියම් සිද්ධියක්, දෙයක් ඒ ආකාරයෙන්ම නැවත කර පෙන්වීම,

1. ක්ෂණික නිරූපණය යි. 2. අනුකරණය යි.

3. සමාරෝපනය යි. 4. අභිරූපණය යි.

11. අධිමානුෂ චරිතයක් වන්නේ,

1. කුකුළු හාමි 2. මී පැටව්

3. දොස්තර මහතා 4. මකරා

12. කතාන්දර කියවීමෙන්, නාට්‍ය හා රංග කලාව හදාරන සිසුන්ට ලැබෙන ප්‍රයෝජනයක් නොවන්නේ,

1. කටහඬ උස් පහත් කරමින් පාලනය කිරීමට හැකිවීම.

2. ශ්වසන පාලනයට හුරු නොවීම.

3. නිවැරදිව වචන උච්චාරණයට හුරු වීම.

4. සබකෝලය දුරු වීම.

13. යම් සිදුවීමක්, දෙයක් වෙනස් විදියට මවා ගැනීම තුළින් අපූර්වත්වයක් ගෙන ඒම,

1. අනුකරණය යි. 2. පරිකල්පනය යි.

3. ආරෝපණය යි. 4. සමාරෝපණය යි.

14. සත්ව චරිත ඇතුළත් නොවන ජන කතාවකි.

1. තොප්පි වෙළෙන්දාගේ කතාව
2. ගමරාළ දිව්‍ය ලෝකෙ ගිය කතාව
3. ලබු කිරිබත් කතාව
4. අනුන්ට කැපූ වළේ තමන් වැටීම.

15. නාට්‍යයක්, ප්‍රේක්ෂකයන් වෙත ඉදිරිපත් කරන මාධ්‍ය වන්නේ,

1. ගීතයයි.
2. නර්තනයයි.
3. අභිනයයි
4. හැඟීම් ප්‍රකාශනයයි

- **හිස්තැනට සුදුසු පදය තෝරා වාක්‍ය සම්පූර්ණ කරන්න.**

16. එක් එක් පුද්ගල චරිත තුළ .................................... රාශියක් ඇත.

17. ජන කතාවක් අසා සිටින්නා .................................... වේ.

18. නාට්‍ය පෙළ යනු .................................... යි.

19. පාරම්පරික සංස්කෘතික දායාදයක් වන්නේ .................................... ය.

20. රංගනයට දායක කරගත හැකි .................................... ගේ චරිතය එදිනෙදා ජීවිතයේ දී අපට හමුවේ.

**(ශ්‍රාවකයා , ජනකතා , භූමිකා , වෛද්‍යවරයා , නාට්‍ය පිටපත)**

(ල.2 x 20 = 40)

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.**

1). ''කරගල ගඟා එනවා මම නොදනිම් ද ?''

(i). ඉහත පාඨය ඇතුළත් ජන කතාවේ නම කුමක්ද ? (ල.02)

(ii). එම ජනකතාවේ ඇතුළත් ප්‍රධාන චරිතයේ නම කුමක්ද ? (ල.02)

(iii). එම ජනකතාවෙන් සමාජයට ලබා දෙන ආදර්ශයක් ලියන්න. (ල.02)

(iv). එම ජන කතාව කෙටියෙන් ලියන්න. (ල.04)

2). (i). අභිනය යන වචනයෙහි තේරුම ලියන්න. (ල.02)

(ii). සතර අභිනය නම් කරන්න. (ල.04)

(iii). ඉන් එක් අභිනයක් පිළිබඳ කෙටි සටහනක් ලියන්න. (ල.04)

3). (i). 'පුංචි අපට දැන් තේරෙයි' නාට්‍යයේ අධ්‍යක්ෂවරිය කවුද ? (ල.02)

(ii). එම නාට්‍යයේ ප්‍රධාන චරිත මොනවාද ? (ල.02)

(iii). එම නාට්‍යයේ තේමාවක් ලියා දක්වන්න. (ල.02)

(iv). කුකුළු හාමිගේ චරිත ලක්ෂණ 2 ක් ලියන්න. (ල.04)

4). පහත සඳහන් පරිසර අත්දැකීම් දෙකෙන් එකක් තෝරාගෙන කතන්දරයක් ගොඩනගන්න.

(i). කැලෑවක් - මුව රංචුවක් - විලක් - කිඹුලෙක් - නියඟයක්

(ii). මී මැසි ජනපදයක් - කැලෑවක් - වර්ෂාවක් - සාදයක් - වලහෙක්

(ල.10)

5). නාට්‍යයක සහ කතන්දරයක වෙනස්කම් 5 බැගින් වෙන වෙනම ලියන්න.

(ල.10)